# කාර්‍ය මණ්ඩල පුවත්

අධිපති, ඩී. ඩබ්ලිව්. රාජපතිරාන මහතා නිල කටයුතු සම්බන්ධයෙන් 1965 මැයි 11 වැනි දින ලංඩනය බලා පිටත් වූයේ, 1965 මැයි 18 වැනි දින පෙරළා ලංකාවට පැමිණියේය.

අධිපති, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ලංකාවේ විකල්ප අධිපති වශයෙන්, වොෂින්ටන්හි පවත්වන ලද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේද, ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුවේද, ජාත්‍යන්තර මුදල් සමායතනයේද, ජාත්‍යන්තර සංවර්ධන සංගමයේද වාර්ෂික රැස්වීම්වලට සහභාගිවීම්වස්, 1965 සැප්තැම්බර් 13 වැනි දින ලංකාවෙන් පිටත්ව ගියේය. ජමෙයිකාවේ, කිංග්ස්ටන්හිදී පවත්වන ලද මුදල් ඇමතිවරුන්ගේ සාකච්ඡා සම්මේලනයට සහභාගි වීමට ද ගරු මුදල් ඇමතිතුමා සමග ගිය අධිපති 1965 ඔක්තෝබර් 11 වැනිදා පෙරළා ලංකාවට පැමිණියේය.

පොදුරාජ්‍ය මණ්ඩලීය මුදල් ඇමතිවරුන්ගේ සාකච්ඡා සම්මේලනයට ද ලෝක බැංකුවේ හා අරමුදලේ රැස්වීම්වලට ද සහභාගි වීම සඳහා එච්. ජේ. සමරක්කොඩි මහතා දිවයිනෙන් බැහැරව ගොස් සිටි කාල සීමාව තුළ මුදල් මණ්ඩලයේ වැඩ බලන නිල සාමාජිකයා වශයෙන්, ජනසතු සේවා අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්, එම්. රාජේන්ද්‍ර මහතා පත් කරන ලදී.

පත් කරන ලද සාමාජිකයා වශයෙන්, ජේ. ත්‍යාගරාජා මහතා, 1965 ජූලි 1 වැනි දින සිට නැවත පත් කරනු ලැබිය.

ආසියා සංවර්ධන බැංකුව පිහිටුවීම පිළිබඳව, බැංකොක්හි පවත්වන ලද නිලධාරීන්ගේ මූලික කමිටු රැස්වීමට සහභාගි වූ නියෝජිත පිරිසේ නායකයා වශයෙන් 1965 ඔක්තෝබර් 20 වැනි දින පිටත්වූ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ඩබ්ලිව්. තෙන්නකෝන් මහතා 1965 නොවැම්බර් 4 වැනි දින පෙරළා ලංකාවට පැමිණියේය. යෝජිත ආසියානු සංවර්ධන බැංකුව පිළිබඳව මැනිලාහි පවත්වන ලද අමාත්‍යවරුන්ගේ සාකච්ඡා සම්මේලනයට හා තානාපතිවරුන්ගේ සාකච්ඡා සම්මේලනයට සහභාගි වූ නියෝජිත පිරිසේ නායකයා වශයෙන් 1965 නොවැම්බර් 26 වැනි දින පිටත්ව ගිය ඔහු, 1965 දෙසැම්බර් 7 වැනි දින පෙරළා ලංකාවට පැමිණියේය.

යෝජිත ආසියා සංවර්ධන බැංකුවේ ඉහළ පෙළේ විශේෂඥයන්ගේ උපදේශක කමිටුවේ ලංකා නියෝජිතයා වශයෙන් ක්‍රියා කිරීමට 1965 ජූනි 20 වැනි දින බැංකොක් බලා ලංකාවෙන් පිටත්ව ගිය නියෝජ්‍ය අධිපති ඩී. සී. ගුණසේකර මහතා 1965 අගෝස්තු 14 වැනි දින පෙරළා ලංකාවට පැමිණියේය. බැංකොක්හි පවත්වන ලද ආසියා සංවර්ධන බැංකුවේ උපදේශක කමිටුවේ රැස්වීමට ද, නිලධාරීන්ගේ මූලික කමිටු රැස්වීමට ද සහභාගි වීම සඳහා 1965 ඔක්තෝබර් 17 වැනි දින නැවතත් ලංකාවෙන් පිටත්ව ගිය ඔහු 1965 නොවැම්බර් 4 වැනි දින පෙරළා ලංකාවට පැමිණියේය.

යෝජිත ආසියා සංවර්ධන බැංකුවේ උපදේශක කමිටු රැස්වීම්වලට සහභාගි වීමට ද, එකී බැංකුව සම්බන්ධයෙන් මැනිලාහි පවත්වන ලද ඇමති මට්ටමේ සාකච්ඡා සම්මේලනයට විකල්ප නියෝජිතයා වශයෙන් සහභාගි වීමට ද 1965 නොවැම්බර් 24 වැනි දින ලංකාවෙන් පිටත්ව ගිය ඔහු 1965 දෙසැම්බර් 7 වැනි දින පෙරළා ලංකාවට පැමිණියේය.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වූ ද, අධිපතිගේ සහකාර වූ ද ආචාර්ය ගාමණී කොරෙයා, ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වශයෙන් 1965 ජූලි 17 වැනි දින සිට රජයේ සේවාව සඳහා මුදා හරින ලදී.

ජාතික ක්‍රම සම්පාදන අධ්‍යක්ෂ වශයෙන් රජයේ සේවාව සඳහා මුදා හරින ලද පී. එච්. සිරිවර්ධන මහතා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ එකී පත්වීම 1965 අගෝස්තු 31 වැනි දින නිමා කරන ලදී. එවක් පටන්, ක්‍රම සම්පාදනය පිළිබඳව අන්තර් ප්‍රාදේශීය උපදේශක වශයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තනතුරක් භාර ගැනීමට, ප්‍රථමයෙන් එක් අවුරුදු කාල සීමාවක් සඳහා, ඔහු සේවාවෙන් මුදා හැර ඇත.

ලංකා ගමනාගමන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී වශයෙන්, රජයේ ඉල්ලීම, පරිදි, සේවාවේ යෙදුනු ආචාර්ය ඩබ්ලිව්. ඇම්. තිලකරත්න 1965 අගෝස්තු 1 වැනි ආපසු බැංකු සේවාවට පැමිණියේය. ඔහු, 1965 අගෝස්තු 1 වැනි දින සිට, වැඩ බලන ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ වශයෙන් පත් කරන ලදී.

ආචාර්ය ඇම්. ආර්. පී. සල්ගාදු, 1965 සැප්තැම්බර් මාසයේ නවසීලන්තයේදී පවත්වන ලද "සියැන්සා" හය වැනි පාඨමාලාවේ විධායක මංඩලයේ සාමාජිකයෙකු වශයෙන්, ක්‍රියා කරන ලදී.

ඩී. ආර්. සිරිවර්ධන මහතා, එක්සත් ජාතීන්ගේ මහා සංගමයේ 20 වැනි සභා වාරයේදී ලංකා නියෝජිත පිරිසේ උපදේශක වශයෙන් ක්‍රියා කරන ලදී.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ, පහත සඳහන් නිලධාරීන්ගෙන් සමහරෙකු තාවකාලික ලෙස රජයේ සේවාවට දුන් අතර, සමහරෙක් රජයේ තාවකාලික සේවාවේ වැඩි දුරටත් නිරතව සිටියහ.

එම්. එම්. සෙනෙවිරත්න, ඩී. ආර්. සිරිවර්ධන, ආචාර්ය එන්. රාමචන්ද්‍රන් සහ එන්. එම්. කප්පගොඩ යන මහත්වරු 1965 ඔක්තෝබර් 1 වැනි දින සිට, ප්‍රථමයෙන් එක් අවුරුදු කාල සීමාවක සේවාව සඳහා ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයට මුදා හරින ලදී.

එස්. කනේසසාසන් මහතා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දෑවුරුදු කාල සීමාවක සේවාව සඳහා මුදා හරින ලදී.

ආචාර්ය ඩබ්ලිව්. රාසපුත්‍රම් ඉරාකයේ ආර්ථික සංඛ්‍යා ලේඛනඥ (ජාතික ගිණුම්) වශයෙන් තනතුරක් භාර ගැනීමට එක් අවුරුදු කාල සීමාවක් සඳහා සේවාවෙන් මුදා හරින ලදී.

එම්. පී. පෙරේරා මහතා, සමූපකාර තොග වෙළෙඳ සංස්ථාවේ අධ්‍යක්ෂ මංඩලයේ සාමාජිකයෙකු වශයෙන් පත් කරන ලදී.

ඕ. ඊ. බී. ගුණවර්ධන මහත්මිය, රජයේ සමායතනවල හා පෞද්ගලික අංශයේ සේවායන් හා සේවකයන් අතර ලාභ බෙදා ගැනීමේ වැඩ පිළිවෙළක් ගැන පරීක්ෂා කර බැලීම සඳහා ඇති කරන ලද පරීක්ෂණ කමිටුවේ ලේකම්වරිය වශයෙන් පත් කරන ලදී.

පී. බී කරඳවල මහතා මුදල් අමාත්‍යාංශයේ සේවාවේ වැඩිදුරටත් නිරත විය.

ආචාර්ය ඩී. එම්. කන්නන්ගර, අභ්‍යන්තර හා බාහිර වෙළෙඳාම් හා සැපයුම් පිළිබඳ අමාත්‍යාංශයේ සේවාවෙහි තවදුරටත් නිරත විය. ලංකා රක්ෂණ සංස්ථාවේ අධ්‍යක්ෂ වරයෙකු වශයෙන් ද ඔහු සේවාවෙහි යෙදුනි.

පී. සී. ඩයස් මහතා, සෝමාලිලන්තයේ ජාතික බැංකුවෙහි ආර්ථික විද්‍යාඥ හා සංඛ්‍යා ලේඛනඥ වශයෙන් සෝමාලිලන්ත රජයේ සේවාවේ තවදුරටත් නිරත විය.

පෙර මෙන්ම, මහ බැංකුවේ නිලධාරීහු බොහෝ දෙනෙක් රජය විසින් පත් කරන ලද විවිධ කමිටුවල සේවාවෙහි නිරත වූහ.